# සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.

**ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES TRADE UNION**

**அனைத்து இலங்கை சமுர்தி மேம்பாடு (வங்கிகள் நிருவனங்கள் மற்றும் அலுவலகங்கள்) அதிகாரிகள் சங்கம்**

**ලි.ප. අංකය 7570 - නිළ වෙබ් ලිපිනය - www.oisbku.com**

අංක , 68 දෙහිදෙනිය ,පේරාදෙනිය

எண் 68, டெஹிடேனியா, பெரடெனியா


2021.06.11

ගරු සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය,ස්වයං රැකියා හා
ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මැතිතුමා.
සමෘද්ධි,ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය,ස්වයං රැකියා හා
ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය,
02 වන අධියර,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

<u>සමෘද්ධි සංර්ධන නිළධාරින්ට බලපාන ගැටළු නොවිසඳීම සම්බන්ධවයි.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් සමෘද්ධි අධිකාරිය අහෝසි කර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේතුව පිහිටුවා මේ වන විට වර්ෂ 09 ක පමණ කාලයක් ඉක්ම ගොස් ඇතත් ඉතා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරණු ලබන (උදා බැංකු කටයුතු,මූලස්ථාන,දිලේ කාර්යාල,ප්‍රධාන කාර්යාලය,බැංකු සමිති යන ආයතන තුල ආයතන හා ගිණුම් ක්‍රියාවලිය,සමාජ සංවර්ධන,පරිසණක,අලෙවි) ආදීවූ සුවිශේෂී කාර්ය භාරයක් හා ක්ෂේත්‍රය තුල විපර්ය කාර්යයන් රාශියක් ඉටුකරණු ලබන සමෘද්ධි සංවර්ධන නිළධාරීන් අවුරුදු 23 ක සේවාකාලයක් හිමි වුවද කිසිඳු උසස්වීමක් නොලබා තවම MN – 1 වැටුප් කාණ්ඩයේ තබා සිටීම.

මේ සම්බන්ධයෙන් මෙම රජය බලයට පත්වීමත් සමඟ සමෘද්ධි සංර්ධන නිළධාරින්ට බලපාන්නා වූ පහත සඳහන් ගැටළු සම්බන්ධයෙන් අප සංගමය සමඟ සාකච්ඡාකර විසඳුම් ලබාදීමට එකඟතාවය පල කළද මේ දක්වාම එම ගැටළු සඳහා කිසිඳු විසඳුමක් ලැබී නොමැති බව මෙයින් දන්වා සිටිමි.මෙම ගැටළු සඳහා ඉතා කඩිනමින් විසඳුම් ලබාදෙන ලෙසට මෙයින් ඉල්ලා සිටිමි.

01 . සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල කාර්යමණ්ඩල පරිපාටිය අනුමත කර ගැනීම.
02 . සමෘද්ධි සංවර්ධන නිළධාරීන් සඳහා වූ MN – 2 වැටුප් කේතය අනුමත කරගැනීමට අදාල කැබිනට් පත්‍රිකාව අනුමත කර ගැනීම.
03 .සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිළධාරීන් අතර ඇතිවී තිබෙන දැඩි වැටුප් විෂමතාවය අඩුකිරීමට අදාලව සකස් කොට ඇති කැබිනට් පත්‍රිකාව අනුමත කිරීම සඳහා වන ප්‍රමාදය.
04 .සමෘද්ධි අධිකාරියේ සිට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කිරීමේදී නව සේවකයන් ලෙස අන්තර්ග්‍රහණය කරණ ලද නිළධාරීන්ගේ වැටුප අඩු නොකිරීමට අදාලව සකස් කරණලද කැබින් පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලයට යොමු නොකිරීම.

මෙම කරුණු සම්බන්ධයෙන් වෘත්තීය සංගසම් හා ගරු අමාත්‍යතුමන්,අමාත්‍යාංශ ලේකම් තුමන්,සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් තුමන් හා සියළු අංශ ප්‍රධානීන්ගේ එකඟතාවයෙන් යුක්තව” ලේකම් , ජාතික වැටුප් හා සේවක කොමිෂම “වෙත යොමුකර ඇති බවට අප සංගමය වෙතට ලිඛිතව දැනුම් දුන් ඉහත සඳහන් ලේඛණ කිසිවක් මේ දක්වා අනුමත නොකිරීම සම්බන්ධයෙන් කණගාටුව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

එසේම සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ගේ කිසිඳු ගැටළුවක් විසඳීමට දේශපාලන අධිකාරිය මෙන්ම තම පැලැන්තියේ නිළධාරීන් ගැන පමණක් සිතන ආයතන ප්‍රධානීන් උත්සහ නොකරණ බවක් අප සංගමයට පෙනීයයි.නමුත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල ප්‍රධාන කාර්යයන් සියල්ල බිම්මට්ටමේදී ඉටුකරණු ලබන්නේ සමෘද්ධි සංවර්ධන නිළධාරීන් බව මෙයින් සිහිපත් කර දෙමි.

එසේම අමාත්‍යතුමන් ඇතුළු අමාත්‍යාංශ නිළධාරීන් ,අධ්‍යක්ෂ ජනරාල් තුමන් ඇතුළු දෙපාර්තමේන්තු ප්‍රධානීන් වැටුප් කමිෂන් සභාව,කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව,රාජ්‍යසේවා කමිෂන් සභාව යන ආයතන වල ප්‍රධාන නිළධාරීන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරණු ලබන්නේ සමෘද්ධි කළමණාකරුවන් පමණක් යැයි සිතා කටයුතු කිරීම පිළිබඳව අප සංගමයේ දැඩි අප්‍රසාදය මෙයින් ප්‍රකාශ කර සිටිමි.


| සභාපති | භාණ්ඩාගාරික | ප්‍රධාන ලේකම් |
|---|---|---|
| එන්.ඒ.එම්.අයි.බී.අබේසිංහ | ආර්.ඩී.කේ.සේනාධීර | බී.එම්.ඒ.වී.බස්නායක |
| දු:අං: 017-2268463 | දු:අං:071-4395535 | දු:අං: 071-8191473 |

| උප සභාපති | උප ලේකම් | ජාතික සංවිධායක |
|---|---|---|
| ටී.ජී.දයාවංශ | බී.ඩී.ජී.වික්‍රමසිංහ | එච්.ජී.සරත් |
| දු:අං: 071-2585394 | දු:අං:076-5566136 | දු:අං:071-8105051 |

**සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.**

**ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES TRADE UNION**

**அனைத்து இலங்கை சமுர்த்தி மேம்பாடு (வங்கிகள் நிருவனங்கள் மற்றும் அலுவலகங்கள்) அதிகாரிகள் சங்கம்**

**ලි.ප. අංකය 7570 - නිළ වෙබ් ලිපිනය - www.oisbku.com**

අංක , 68 දෙහිදෙනිය ,පේරාදෙනිය

எண் 68, டெஹிடேனியா, பெரடெனியா

2021.06.11

මෙම සිතිවිල්ල මත පිහිටා කටයුතු කිරීම නිසාම සමෘද්ධි හා දිළිඳුකම පිටුදැකීමේ අමාත්‍යාංශයේ අමාත්‍ය තුමිය විසින් 2005/06/07 දින ඉදිරිපත් කොට අනුමත කර ඇති කැබිනට් පත්‍රිකාව මගින් 1996,1999 කාලවකවානුව ඇතුලත බඳවාගත් සමෘද්ධි කළමණාකරුවන් සඳහා පමණක් MN – 7 දක්වා යාහැකි උසසවීම් ක්‍රමවේදයක් සකස්කර දී ඇත.මෙම හේතුව නිසාම අදවන විට කළමණාකරුවන් හා අනෙකුත් නිළධාරී කාණ්ඩ අතර ඉතා විශාල වැටුප් විෂමතාවයක් නිර්මාණය වී ඇති බව මෙයින් පෙන්වා දෙමි.

| නිළධාරී කාණ්ඩය | මූලික වැටුප | වෙනස |
|---|---|---|
| කළමණාකරු - සමෘද්ධි සංවර්ධන නිළධාරි | 69000.00 – 40990.00 | 28010.00 |
| කළමණාකරු - කළමණාකරණ සහකාර | 69000.00 – 40990.00 | 28010.00 |
| කළමණාකරු - රියදුරු | 69000.00 – 32690.00 | 36310.00 |
| කළමණාකරු - කාර්යාල කාර්ය සහයක | 69000.00 – 32690.00 | 35770.00 |

මෙම වැටුප් විෂමතාවය අවම කිරීම සඳහා මේ පිළිබඳව 2021 පෙබරවාරි මස අමාත්‍යාංශ අතිරේක ලේකම් අශෝකා අලවත්ත මහත්මිය නිමල් කොටවලගෙදර මහතා , සමෘද්ධි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලිපිකරු උපුල් ජයශාන්ත මහතා සහ අප සංගමයේ ඍජුව මැදිහත් වෙමින් ඉහත සඳහන් සියලු කාණ්ඩ වලට සාධාරණ හා සුභවාදීව යෝජනාවලියක් සකස් කර කැබිනට් අනුමැතියට යොමුකිරීමට අවශය කටයුතු සියල්ල නිමකර තිබියදී එය ඉවතලා කටයුතු කිරීම සිදුකරගෙන යන බව අපහට පෙනීයයි.

එම නිසාම අතිගරු ජනාධිපතිතුමන් සමඟ 2021.02.23 දින පැවති වෘත්තීය සමිති සාකච්ඡාවෙදී සංගමයේ ගරු සභාපති තුමන් ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් දීර්ඝ ලෙස කරුණු ඉදිරිපත් කරණ ලදී.එහි ප්‍රතිඵලයක් ලෙස 2021.03.15 දින ගරු අග්‍රාමාත්‍ය තුමන් විසින් අප අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යතුමන්,රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් තුමන්,සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් තුමන්,ප්‍රමුඛව වැටුප් කමිෂන් සභාව,කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව,රාජ්‍යසේවා කමිෂන් සභාව යන ආයතන වල ප්‍රධාන නිළධාරීන් කැඳවා මෙම ගැටලු වලට ඉතාම කඩිනමින් විසඳුම් ලබාදෙන ලෙසට උපදෙස් ලබාදෙන ලදී.නමුත් ඉහත සඳහන් නිළධාරීන්ගේ නිළධාරී වාදයත් වගකීම් විරහිත ක්‍රියාකළාපයත් නිසා අපගේ ගැටලු කිසිවක් නොවිසඳෙන තත්වයක් උද්ගතව ඇත.එය අප සංගමයේ මෙන්ම දෙපාර්තමේන්තුවේ සමස්ත නිළධාරීන්ගේ දැඩි කළකිරීමට හේතුවී ඇත.

එම නිසාඅප මෙන්ම අතිගරු ජනාධිපතිතුමන්, ගරු අග්‍රාමාත්‍ය තුමන් ප්‍රමුඛ වර්තමාන රජය අපහසුතාවයට පත් නොකර අමාත්‍යාංශයේ වගකිවයුතු නිළධාරීන්,සියලු කමිෂන් සභාවල නිළධාරීන් අපගේ මෙම ඉල්ලීම් සඳහා ඉතා කඩිනමින් විසඳුම් ලබාදෙන ලෙසට කටයුතු කරණ ලෙසට දන්වා සිටින අතර එසේ නොවන්නේ නම් අප සංගමය වෘත්තීය ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය තීන්දු තීරණ ගන්නා බවත් අවශ්‍ය වන්නේනම් අධිකරණ ක්‍රියාමාර්ගයන්ට එළඹීමට කටයුතු කරණ බවත් මෙයින් කණගාටුවෙන් වුවද දන්වා සිටිමි.

පිටපත් :- 01 . ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ
අතිගරු ජනාධිපති තුමා (කා:දැ:ගැ: හා අ:කා:ස:)
02 . ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ
ගරු අග්‍රාමාත්‍ය තුමා . (කා:දැ:ගැ: හා අ:කා:ස:)
03 . වැටුප්හා සේවක කමිෂන් සභාව (කා:දැ:ගැ: හා අ:කා:ස:)
04 . රාජ්‍ය සේවා කමිෂන් සභාව (කා:දැ:ගැ: හා අ:කා:ස:)
05 . කළමණාකරණසේවා දෙපාර්මේන්තුව (කා:දැ:ගැ: හා අ:කා:ස:)
06 . අධ්‍යක්ෂ ජනරාල් තුමා සමෘද්ධි දෙපාර්මේන්තුව (කා:දැ:ගැ: හා අ:කා:ස:)

සභාපති
එන්.ජ්.එම්.අයි.බී.අබේසිංහ
දු:අං: 017-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු:අං:071-4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ජ්.වී.බස්නායක
දු:අං: 071-8191473

උප සභාපති
ටී.ජී.දයාවංශ
දු:අං: 071-2585394

උප ලේකම්
බී.ඩී.ජී.වික්‍රමසිංහ
දු:අං:076-5566136

ජාතික සංවිධායක
එච්.ජී.සරත්
දු:අං:071-8105051